# 8 උතුරෙන්

**සාගර පලන්සූරිය (1910-1961)**

නූතන යුගයේ මුල් පරපුරට අයත් වන ජනප්‍රිය කවීන් කිහිපදෙනා අතර ප්‍රමුඛයකු වූ සාගර පලන්සූරිය කවියා 'කේයස්' යන අන්වර්ථ නාමයෙන් පුවත්පත් හා සඟරා සඳහා නිර්මාණ ඉදිරිපත් කළේ ය. ප්‍රවීණ ලේඛකයකු, කවියකු, දේශකයකු පමණක් නොව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ද වූ හෙතෙම ගුරුවරයකු ලෙස ද සේවය කළේ ය.

ටෙනිසන් නැමැති ඉංග්‍රීසි කවියා ගේ (ඊනොක් ආර්ඩන්) නමැති කාව්‍යය ආශ්‍රයෙන් රචනා කරන ලද 'සුදෝසුදු' මොහුගේ ප්‍රකට ම කෘතිය වන අතර **මල්හාමි, කාලකණ්ණියා, කන්දේ ගෙදර, විසිවුණු තරු, කැලණි විත්ති, පිළිරුව** හා **අපේ ඇත්තන්ගෙ විත්ති** ආදි කෘති ද එතුමගේ නිර්මාණ වේ.

කාව්‍ය නිර්මාණ සඳහා විදේශ කාව්‍ය නොමඳ ව ඇසුරු කළා වූ යුගයක ඇතැම් කවීන් මෙන් ජීවිතයේ ශෘංගාරාත්මක හා ප්‍රේමණීය පක්ෂය නිරූපණය කිරීමට වඩා කේයස් යොමු වූයේ මානව දයාව හා ප්‍රේමය කුළුගැන්වීම කෙරෙහිය.



පවත්නා සමාජ ක්‍රමය පිළිබඳ සියුම් විරෝධාකල්පමය මතවාදයක් කුළුගැන්වෙන මොහුගේ කවිය කෙරෙහි මධ්‍යස්ථ විචාරක අවධානයක් නොවීම කරණ කොට සෙසු බොහෝ කවීන්ට මෙන් ම සාධාරණ අවධානයක් සහ ඇගයීමක් සිදු නොවී ය.

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නඟියි උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ

ගෙන එයි මිහිරි ගී මඳනල හමන          විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු          මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව          පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු          ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය          ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු          නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය          මත
උගතිමි කිම ද මිනිසා සතු දෙ නෙත          තෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර          වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම          සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි          හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන          ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ          කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි          පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන          විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස          මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන          රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු          විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු          පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු          දෙසින්

පැයක දී එකට හමු වන දුර ඇත          දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද          කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ          ඔතන
බේදය පිළිස්සී හමු වේවා          දකුණ

## ලිඛිත අභ්‍යාස

1. 'උතුරෙන්' කාව්‍ය නිර්මාණයට පාදක වී ඇති තේමාව විග්‍රහ කරන්න.
2. උතුරෙන් පැදි පෙළ කාලීන වටිනාකමකින් යුක්ත නිර්මාණයකි. ඔබේ අදහස් දක්වන්න.
3. සිය නිර්මාණය සඳහා සාගර පලන්සූරිය යොදා ගෙන ඇති කාව්‍යෝක්ති එහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති ආකාරය විමසන්න.